#mediaethicsSL #SinhalaPress #lka #SundayMawbima

ව්‍යාපාරික හෝ කර්තෘ මණ්ඩල නොවන පාර්ශව මගින් ගෙවීම් හෝ වෙනත් ප්‍රතිලාභ දෙනු ලබන දැන්වීම් ප්‍රචාරණය හෝ ප්‍රවර්ධනය සඳහා ලියා ඇති ලිපි ලේඛන වල ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුය යනුවෙන් ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් හඳුන්වා දී ඇති වෘත්තීය ආචාර ධර්ම පද්ධතියේ සඳහන් වේ. මෙම කරුණ වැදගත් වන්නේ, ඉරිදා මව්බිම පාරදිගේ ලිපිය වැනි ලිපි සම්බන්ධයෙන් අවධානය යොමු කරනා විටයි. මෙය සම්පූර්ණයෙන්ම නොමිලේ ප්‍රතිකාර කරන පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරයෙකු හා සිදුකළ කථාබහක් අනුව සම්පාදනය කොට ඇති අතර, එම වෛද්‍යායතනය සම්බන්ධ කරගත හැකි තොරතුරුද ලබාදී ඇත.

මෙහිදී අපට කරුණු කිහිපයක්, පාඨකයින් ලෙස සලකා බැලීමට හැකියාව ඇත. මෙය මුදල් අයකිරීමකින් තොරව ලියැවුණු ලිපියක් යැයි සිතමු. එවන් සාකච්ඡා ලිපි ඕනෑ තරම් පුවත්පත් තුළ පලවේ. එනමුත්, මෙහිදී එම වෛද්‍යවරයා පළ කර ඇති අදහස් අනුසාරයෙන් මෙම ලිපිය ලියැවුණද, එම ලිපියේ අන්තර්ගත කරුණු සම්බන්ධ පූර්ණ වගකීම පුවත්පත දරන්නේද යන්න විමසිය යුතුය. මන්දයත්, මෙහි දක්වා ඇති ඇතැම් කරුණු කාරණාවන් වෛද්‍ය විද්‍යාත්මකව හෝ නිවැරදි වන්නේද, එසේ නිවැරදි යැයි තහවුරු කොට ඇත්තේ නම් ඒ සම්බන්ධ මූලාශ්‍රයන් සඳහන් කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේද යන කුකුස පැන නගිනා බැවිනි. අනෙක් අතට මෙය දැන්වීම් ප්‍රචාරණය අරමුණු කොටගෙන ලියා පළ කොට ඇති ලිපියක් නම්, එම ලිපියේ අන්තර්ගත කරුණු සම්බන්ධ වගකීම එම දැන්වීම් ප්‍රචාරණයට මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ ලබාදෙන ආයතනයට අයත් වන්නේ යැයි සිතීමට හැකිද? එය එසේ නම් පුවත්පතට ඒ සම්බන්ධයෙන් වගකීමෙන් නිදහස් විය හැකි වුවත්, මෙය දැන්වීම් ප්‍රචාරණය හෝ ප්‍රවර්ධනය සඳහා ලියා ඇති බව එසේ නම් පැහැදිලිවම ලිපියේ සඳහන් විය යුතු නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?